# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව


ශ්‍රී ලංකා මහ බැංකුව

**2022 අප්‍රේල්**


**04 වෙළුම 04 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2022 වසරේ අප්‍රේල් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 970ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 18.5කින් ඉහළ ගියේය.

2022 වසරේ අප්‍රේල් මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,699ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 0.5කින් පහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)





2022 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී අපනයන ආදායම සහ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 11.0කින් සහ සියයට 8.9කින් ඉහළ ගියේය.

වෙළඳ ගිණුමේ හිඟය, 2021 වසරේ අප්‍රේල් මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 889ට සාපේක්ෂව, 2022 වසරේ අප්‍රේල් මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 729ක් දක්වා අඩු විය.


## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2022 ජන.- අප්‍රේල්)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන) / ආනයන (එ.ජ. ඩොලර් මිලියන)




# අපනයන ක්‍රියාකාරිත්වය

## අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.-අප්‍රේල්)




## අපනයන පරිමා හා මිල දර්ශක (ජන.-අප්‍රේල්)




2022 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී, ප්‍රධාන වශයෙන් කාර්මික අපනයන ඉහළ යෑම හේතුවෙන් අපනයන ආදායම ඉහළ ගියේය. එසේ වුවත්, කෘෂිකාර්මික සහ ඛනිජමය අපනයන පහළ යෑමක් වාර්තා කළේය.


2022 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී, අපනයන පරිමා දර්ශකය සහ අපනයන මිල දර්ශකය, පිළිවෙළින්, සියයට 8.4කින් සහ සියයට 2.4කින් ඉහළ ගියේය.

# කෘෂිකාර්මික අපනයන


## කෘෂිකාර්මික අපනයන ආදායම





## කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-අප්‍රේල්)






## තේ සහ රබර් මිල ගණන් *






2022 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී, තේ, කුළුබඩු (ප්‍රධාන වශයෙන්, කරාබුනැටි), සකස් නොකළ දුම්කොළ සහ එළවළු අපනයන ආදායම පහළ යෑමත් සමඟ කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, පොල්, මුහුදු ආහාර (ප්‍රධාන වශයෙන්, කෙළවල්ලන්), සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, පුවක් හා තල ඇට) සහ රබර් ඉහළ අපනයන ආදායම් වාර්තා කළේය.

## කාර්මික අපනයන












2022 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජතෙල් නිෂ්පාදිත, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, සහ මූල ලෝහ හා උපාංග අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී මු ණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, මුදල් නෝට්ටු), ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, ප්ලාස්ටික් පෙට්ටි) සහ රසායනික නිෂ්පාදිත අපනයන ආදායම පහළ ගියේය.

## ආනයන ක්‍රියාකාරිත්වය






අතරමැදි භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2022 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. මේ අතර, මෙම කාලපරිච්ඡේදය තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ආනයන පරිමා දර්ශකය සියයට 8.6කින් පහළ ගිය අතර, ආනයන මිල දර්ශකය සියයට 19.2කින් ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය
(ජන. - අප්‍රේල්)





සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ
ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ප්‍රධාන වශයෙන්, විදුලි සංදේශ මෙවලම් (ප්‍රධාන වශයෙන්, ජංගම දුරකථන) ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2022 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. තවද, ආහාර හා පාන වර්ග කාණ්ඩය යටතට ගැනෙන සීනි හා රසකැවිලි සහ තෙල් හා මේද වර්ග ආනයන වියදමෙහි පහළ යෑම් දක්නට ලැබුණි. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන් කොටන ලද සහල්), රෙදිපිළි හා උපාංග සහ පාන වර්ග (ප්‍රධාන වශයෙන්, මධ්‍යසාර පාන වර්ග) සඳහා වන ආනයන වියදම් ඉහළ අගයක පැවතිණි.

# අන්තර් භාණ්ඩ ආනයන


අන්තර් භාණ්ඩ ආනයන වියදම





අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



### අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-අප්‍රේල්)




### බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)





*2021 වසරේ මාර්තු, ජූනි,සැප්තැම්බර්, නොවැම්බර් මාසවල සහ 2022 වසරේ මාර්තු හා අප්‍රේල් මාසවල බොරතෙල් ආනයනය කර නැත.


ප්‍රධාන වශයෙන්, ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ඛනිජමය නිෂ්පාදිත සහ කඩදාසි, සන කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2022 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුවත්, 2022 වසරේ අදාළ කාලපරිච්ඡේදය තුළ පොහොර, තිරිඟු සහ ආහාර සැකසුම් (ප්‍රධාන වශයෙන්, පාම් තෙල්) ආනයන වියදම පහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


### ආයෝජන භාණ්ඩ ආනයන වියදම




### ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-අප්‍රේල්)




යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ප්‍රවාහන උපකරණ ආනයන පහළ යෑම හේතුවෙන් 2022 වසරේ අප්‍රේල් මාසයෙන් අවසාන වන මාස හතර තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම පහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඉහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | අප්‍රේල්- 2021 | අප්‍රේල් - 2022 | වෙනස (%) | ජන. -අප්‍රේල් 2021 | ජන.-අප්‍රේල් 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **165.6** | **177.7** | **7.3** | **829.4** | **783.5** | **-5.5** |
| එයින් | තේ | 79.3 | 80.4 | 1.5 | 417.4 | 367.2 | -12.0 |
| | පොල් | 27.3 | 34.0 | 24.5 | 123.6 | 138.8 | 12.2 |
| | කුළුබඩු | 22.4 | 21.4 | -4.2 | 136.2 | 106.8 | -21.6 |
| | මුහුදු ආහාර | 19.2 | 21.2 | 10.6 | 75.6 | 88.9 | 17.7 |
| **කාර්මික අපනයන** | | **647.1** | **789.0** | **21.9** | **2,949.4** | **3,416.9** | **15.8** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 366.0 | 447.7 | 22.3 | 1,699.5 | 1,924.6 | 13.2 |
| | රබර් නිෂ්පාදිත | 61.6 | 68.1 | 10.7 | 317.9 | 319.8 | 0.6 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 36.3 | 58.5 | 61.2 | 122.1 | 238.0 | 94.9 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 35.0 | 41.1 | 17.2 | 167.4 | 179.8 | 7.4 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 31.0 | 40.7 | 31.1 | 156.0 | 174.5 | 11.8 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 24.2 | 25.5 | 5.2 | 95.0 | 119.1 | 25.4 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 3.8 | 7.6 | 102.1 | 14.9 | 24.6 | 64.9 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **5.5** | **3.1** | **-43.8** | **21.5** | **18.7** | **-13.2** |
| **මුළු අපනයන** | | **818.2** | **969.8** | **18.5** | **3,800.3** | **4,219.1** | **11.0** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | අප්‍රේල්- 2021 | අප්‍රේල් - 2022 | වෙනස (%) | ජන. -අප්‍රේල් 2021 | ජන.-අප්‍රේල් 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **278.6** | **235.8** | **-15.4** | **1,276.5** | **1,176.6** | **-7.8** |
| **ආහාර හා පාන වර්ග** | | 123.5 | 148.0 | 19.8 | 628.8 | 660.6 | 5.0 |
| එයින් | එළවළු (ආ) | 26.9 | 32.2 | 19.4 | 138.0 | 122.8 | -11.0 |
| | සහල් | 1.2 | 28.6 | 2,245.6 | 2.9 | 118.1 | 3,934.0 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 155.1 | 87.7 | -43.4 | 647.7 | 516.0 | -20.3 |
| එයින් | පෞද්ගලික රථවාහන | 1.1 | 0.6 | -48.5 | 3.5 | 2.7 | -25.1 |
| **අන්තර් භාණ්ඩ** | | **1,075.0** | **1,196.6** | **11.3** | **4,065.7** | **4,806.6** | **18.2** |
| එයින් | ඉන්ධන | 413.2 | 510.1 | 23.5 | 1,390.3 | 1,922.4 | 38.3 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 228.4 | 281.2 | 23.1 | 938.6 | 1,161.7 | 23.8 |
| | පොහොර | 47.3 | 20.5 | -56.6 | 82.2 | 42.1 | -48.9 |
| | තිරිඟු හා ඉරිඟු | 26.7 | 21.0 | -21.6 | 120.2 | 102.7 | -14.6 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **353.4** | **266.6** | **-24.5** | **1,405.9** | **1,367.0** | **-2.8** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 227.9 | 179.6 | -21.2 | 913.0 | 874.8 | -4.2 |
| **මුළු ආනයන** | | **1,707.0** | **1,699.0** | **-0.5** | **6,748.1** | **7,350.2** | **8.9** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | අප්‍රේල්- 2021 | අප්‍රේල් - 2022 | වෙනස (%) | ජන. -අප්‍රේල් 2021 | ජන.-අප්‍රේල් 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -888.8 | -729.2 | | -2,947.8 | -3,131.1 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | අප්‍රේල්- 2021 | අප්‍රේල් - 2022 | වෙනස (%) | ජන. -අප්‍රේල් 2021 | ජන.-අප්‍රේල් 2022 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 113.9 | 135.0 | 18.5 | 132.2 | 146.8 | 11.0 |
| | පරිමා දර්ශකය | 152.7 | 162.1 | 6.2 | 147.7 | 160.1 | 8.4 |
| | මිල දර්ශකය | 74.6 | 83.3 | 11.6 | 89.5 | 91.7 | 2.4 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 152.8 | 152.1 | -0.5 | 151.0 | 164.5 | 8.9 |
| | පරිමා දර්ශකය | 177.2 | 141.7 | -20.0 | 172.6 | 157.7 | -8.6 |
| | මිල දර්ශකය | 86.2 | 107.3 | 24.4 | 87.5 | 104.3 | 19.2 |
| **වෙළඳ මිල අනුපාතය** | | 86.5 | 77.6 | -10.3 | 102.3 | 87.9 | -14.1 |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද